# ශ්‍රී ලංකා දුම්රිය සේවය

## ලංසු ආරාධනය

### ශ්‍රී ලංකා දුම්රිය සේවයේ S 10 පංතියේ ඩීසල් බහු ඒකක එන්ජින් පණගැන්වීම සඳහා ඇල්කලයින් (ALKALINE) බැටරි 495 ක් මිල දී ගැනීම සඳහා ප්‍රසම්පාදනය

**IFB අංක - SRS F.7877**

1. ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් **S 10 පන්තියේ ඩීසල් බහු ඒකක එන්ජින් පණගැන්වීම සඳහා ඇල්කලයින් (ALKALINE) බැටරි 495ක් මිලදී ගැනීම** වෙනුවෙන් නිෂ්පාදකයින්/සැපයුම්කරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු කැඳවා සිටී. නිෂ්පාදකයින්ට ඇටෝර්නි හෝ සාජුව බලය ලත් නියෝජිතයෙකු හරහා තම ලංසු ඉදිරිපත් කළ හැක.

2. ලංසු කැඳවීම ජාත්‍යන්තර තරගකාරිත්ව ලංසු පටිපාටිය (ICB) අනුව සිදු කෙරෙනු ඇත.

3. උනන්දුවක් දක්වන යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්ට **2024.01.18** සිට **2024.03.04** දක්වා **9.00** පැය සිට **15.00** පැය දක්වා වැඩ කරන දිනයන්හිදී පහත දක්වා ඇති ලිපිනයෙන් වැඩිදුර තොරතුරු ලබාගැනීමට සහ ලංසු ලේඛන පරීක්ෂා කිරීමට හැකිය.

   **නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ප්‍රසම්පාදනය),**
   **දුම්රිය මාර්ගය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුව,**
   **ඕල්කට් මාවත, කොළඹ 10,**
   **ශ්‍රී ලංකාව.**
   **දුරකථන අංක : +94 (11) 2438078 හෝ +94 (11) 2436818**
   **ෆැක්ස් අංකය : +94 (11) 2432044**
   **ඊ මේල් : srs.slr@gmail.com**
   **වෙබ් අඩවිය : www.railway.gov.lk**

4. ලංසුකරු / නිෂ්පාදකයා පිළිගත් ජාත්‍යන්තර ප්‍රමිතියකට වසර 05 කට වැඩි කාලයක් Alkaline බැටරි නිෂ්පාදනය කළ යුතු අතර, නිෂ්පාදකයා / සැපයුම්කරු පසුගිය වසර තුන (03) තුළ Alkaline බැටරි 500 ක් හෝ ඊට වැඩි ගණනකින් තොග ඇණවුම් තුනක් (03) සම්පූර්ණ කර තිබිය යුතුය. ඉන් එකක් විදේශ දුම්රියකට විය යුතුය.

5. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට **2024.01.18** සිට **2024.03.04** දක්වා **15.00** පැය තෙක් නැවත ගෙවනු නොලබන **රු. 11,825/-** ක ප්‍රසම්පාදන ගාස්තුවක් ගෙවා ලිඛිත අයදුම්පත්‍රයක් ශ්‍රී ලංකා දුම්රිය, ඕල්කට් මාවත, කොළඹ 10 යන ලිපිනයට යොමු කිරීමෙන් ඉංග්‍රීසි භාෂාවෙන් ඇති සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් මිල දී ගත හැකිය.

6. සෑම ලංසුවක්ම ලංසු ආරක්ෂණයක් සමග ඉදිරිපත් කළ යුතුය. ලංසු සුරක්ෂණ මුදල **රු. 470,000.00** ක් විය යුතු අතර, ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කළ කොන්දේසි විරහිත ඇපකරයක් විය යුතුය.

7. **2024.03.05** දින **14.00** පැය හෝ එදිනට පෙර පහත ලිපිනයට ලංසු එවිය යුතු අතර, ලංසු භාරගැනීම අවසන් වූ වහාම විවෘත කරනු ලැබේ. මෙම ලංසු විවෘත කිරීමේදී පෙනී සිටින මෙන් ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින් වෙතින් ඉල්ලා සිටිනු ලැබේ. ප්‍රමාද වී ලැබෙන ලංසු භාරගනු නොලැබේ.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),**
**ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තු කාර්යාලය,**
**ශ්‍රී ලංකා දුම්රිය සේවය,**
**ඕල්කට් මාවත, කොළඹ 10.**

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),